**1.** **තනතුර - සෞඛ්‍ය සහකාර**

**2.** **වයස** - අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව අදාල නොවේ.

**3.** **සුදුසුකම්**

**අ.** **බාහිර අයදුම්කරුවන්**

තනතුරෙහි කාර්යභාරයට අදාළව තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ලද ජාතික වෘත්තීය කුසලතා (NVQ) පහ (05) වැනි මට්ටමට නොඅඩු මට්ටමකින් සෞඛ්‍ය ක්ෂේත්‍රයට අදාලව ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

**ආ.** **අභ්‍යන්තර අයදුම්කරුවන්**

ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් අදාළ වේ.

**ඇ.** **වෙනත්**

i. සෑම අයදුම්කරුවෙකුම ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

ii. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරිම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

iii. විශිෂ්ඨ චරිතයෙන් යුක්ත විය යුතුය.

**4.** **වැටුප් තලය**

ස්ථිර වැටුප් පරිමාණය - MA 2-2 2025

මූලික වැටුප - රු. 46,960.00 (2026), රු. 50,540.00 (2027)

ජීවන වියදම් දීමනාව රු: 17,800 හිමි වේ.

වාර්ෂික වැටුප - 46,960.00 +17800.00x12 = රු. 777,120.00 (2026)

50,540.00 +17800.00x12 = රු. 820,080.00 (2027)

**5.** **රාජකාරී ස්වභාවය**

i. අභ්‍යාසලාභීන්ගේ ශාරීරික හා මානසික තත්ත්වය නිශ්චය කිරීමට හැකි වන පරිදි අවශ්‍ය අවස්ථාවලදී මූලික වෛද්‍ය ආධාර/ ප්‍රථමාධාර අදාල සේවාවන් ලබාදීම මෙම සේවා ගණයට අයත් සේවකයින් විසින් ඉටු කරනු ලැබිය යුතුය.

ii. පුනරුත්ථාපනය සඳහා යොමු කරනු ලබන අන්තරායකර ඖෂධ වලට ඇබ්බැහි වූ පුනරුත්ථාපනලාභින්ගේ සහ කාර්ය මණ්ඩලයේ රෝගී තත්ත්වයන්හිදී මූලික ප්‍රතිකාර හෝ විමර්ශණයන් සිදු කිරීම හා වැඩිදුර ප්‍රතිකාර අවශ්‍ය වන්නේ නම් වෛද්‍යවරයා වෙත යොමු කිරීම.

iii. අනියුක්ත කර ඇති වෛද්‍යවරයාගේ උපදෙස් මත වැඩිදුර ප්‍රතිකාර අවශ්‍ය වන්නේ නම් ඒ සඳහා ලඟම පිහිටි රෝහලක් වෙත යොමු කිරීම.

iv. හදිසි අවස්ථාවන්හිදී පුනරුත්ථාපනලාභීන්ගේ රෝගී තත්ත්වයන් නිරීක්ෂණය හා අධීක්ෂණය කිරීම තුලින් අනියුක්ත කර ඇති වෛද්‍යවරයාගේ උපදෙස් මත ප්‍රතිකාර සිදු කිරීම.

v. සායනික රාජකාරි සඳහා වෛද්‍යවරයාට සහාය වීම. අනියුක්ත කර ඇති වෛද්‍යවරයාගේ උපදෙස් මත රෝගීන් පරීක්ෂා කිරීම/ රෝගීන් සඳහා ප්‍රතිකාර සිදු කිරීම.

vi. පුනරුත්ථාපනලාභීන්ගේ පෝෂණ සෞඛ්‍ය ප්‍රවර්ධනය කිරීමට අවැසිව ලබාදී ඇති උපදෙස් ක්‍රියාත්මක කිරීම.

vii. පුනරුත්ථාපනලාභීන් බාහිර රෝහල් වෙතින් ප්‍රතිකාර ලබාගැනීමේදී ඒ සඳහා අවැසි සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම.

viii. අනුයුක්ත වෛද්‍යවරයාගේ උපදෙස් මත අවැසි වෛද්‍ය සායන සංවිධානය කිරීමට අවශ්‍ය සහාය දැක්වීම.

ix. වෛද්‍ය කටයුතු වලට අදාල සියලුම ලිපි ලේඛන සහ පොත්පත් නිවැරදිව යාවත්කාලීන කරමින් පවත්වාගෙන යාම.

x. විශේෂ අවශ්‍යතා සහිත පුනරුත්ථාපනලාභීන්ගේ දෛනික කටයුතු සඳහා සහාය වීම.

xi. වෛද්‍ය නියාමන උපදෙස් මත අවශ්‍ය ඖෂධ තොග තත්ත්වයන් පවත්වාගෙන යාම.

xii. වෛද්‍ය මධ්‍යස්ථානය ක්‍රමවත්ව හා පිරිසිදුව පවත්වා ගෙන යාම.

xiii. වසංගත/ බෝවන රෝග නියාමනය කර ගැනීම හා බෝ නොවන රෝග පාලනය කර ගැනීමට පුනරුත්ථාපනලාභීන් හට අවැසි උපදෙස් ලබාදීම./පසුවිපරම් කිරීම.